# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/LH/Circular/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.02.22 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක 2021 / 05**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත,

## සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන.

උක්ත වැඩසටහන සම්බන්ධයෙන් සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති SMS/DEV/HEU/GEN/02 හා 2021.02.18 දිනැති චක්‍රලේඛයට වැඩිමනත් වශයෙනි.

2021 වර්ෂයේ අයවැය යෝජනා අනුව අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් හා ආශ්‍රිත ගම්මාන බලසම්පන්න කිරීමේ වැඩසටහන යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත පහත සඳහන් විශේෂ වැඩසටහන් 03 සම්බන්ධයෙන් මේ වන විටත් ඔබව දැණුම්වත් කර ඇත.

1. සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීම.
2. සමෘද්ධිලාභි / අඩුආදායම්ලාභි තරුණ කාන්තා ව්‍යවසායකයින් 25,000 ක් ඉලක්ක කර ගෙන සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාශයකම ගෘහස්ථ වෙළඳසැල් පිහිටු වීම.
3. 7% ක සහන පොළි අනුපාතයක් යටතේ ලක්ෂ 20ක් දක්වා ණය මුදලක් ලබා දීම

**වැඩසටහන්හි අපේක්ෂිත අරමුණු**

a) අංගසම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සහිතව සමෘද්ධිලාභි හා අඩුආදායම්ලාභි පවුල් සවිබලගැන්වීම.

b) වෙළඳපල ජාලය ශක්තිමත් කිරිම මඟින් දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරිම

c) වෘත්තීය පුහුණුව හා ව්‍යවසාය සංවර්ධනය මඟින් විරැකියාව අඩු කිරිම.

d) නිෂ්පාදන ගම්මාන ඇති කිරිම මඟින් විශේෂිත නිෂ්පාදන දිරිමත් කිරිම.

e) වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය වැඩිකර ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරිම.

f) අවිධිමත් ණය සඳහා යොමුවීම අඩුකර සහනදායි පොලී අනුපාතයන් යටතේ ණය ලබා දීම.

g) ගෘහස්ථ මට්ටමින් බලශක්ති උත්පාදනය හා පරිසර හිතකාමි ජීවන රටාවකට ජනතාව හුරු කිරිම.

## සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් (200,000) ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන

සමෘද්ධිලාභි පවුල් 200,000 ක් සවිබලගැන්වීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන යටතේ පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරිමට හැකිවනු ඇත.

**ක්‍රියාකාරකම්.**

i. කෘෂිකර්මාන්ත ව්‍යාපෘති හා ගෙවතු වගා වැඩසටහන
ii. සත්ත්ව පාලන වැඩසටහන
iii. ධීවර වැඩසටහන
iv. ගෘහ ආශ්‍රිත කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධනය
v. රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු වැඩසටහන
vi. අලෙවි සංවර්ධන වැඩසටහන
vii. තිරසර පරිභෝජන හා ගෘහ ආර්ථිකය කළමනාකරණය.

### ව්‍යාපෘති හඳුනා ගැනීම

ව්‍යාපෘති හඳුනා ගැනීමේදි පහත ක්ෂේත්‍රයන් පිළිබඳ නිපුනතාවක් හා තාක්ෂණික දැනුම ඇති රේඛීය අමාත්‍යාංශ /ආයතන මඟින් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා වඩා ශක්‍යතාවකින් යුත් ව්‍යාපෘතීන් හා වැඩසටහන් හඳුනා ගනු ලබන අතර ඒ කෙරෙහි ප්‍රමුඛත්වය යොමු කරමින් දිස්ත්‍රික් / ප්‍රාදේශිය හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සංවර්ධන සැලැස්ම සකස් කළ යුතුවේ.

**i. කෘෂිකර්ම ව්‍යාපෘති හා ගෙවතු වගා වැඩ සටහන්**

- කෘෂිකර්මාන්ත සහ එහි අගයදාමය ව්‍යාපෘති සංවර්ධනය. අපනයන අභිමුඛ හා ආනයන ආදේශන ආදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම. ඔබ විසින් හඳුනාගත් ප්‍රතිලාභින් සඳහා පලතුරු, ඖෂධ, සුළු අපනයන භෝග හා පොල් පැල ලබා දීම, වන ශාක හා බිත්තර සඳහා කිකිළි පැටවුන් ලබා දීම සිදු කරනු ඇත.
- 2020 වසරේ මහ කන්නයේදි සාර්ථකව පැල තවාන පවත්වා ගෙන ගිය මේ වන විටත් වඩාත් සාර්ථකව පවත්වා ගෙන යන පැල තවාන්කරුවෙක් වසම් මට්ටමින් හඳුනා ගැනිම හා ව්‍යාපෘති ප්‍රතිලාභ ලබා දීම.

**ii.සත්ත්ව පාලන වැඩසටහන**

- සත්ත්ව අභිජනනය ගොවිපොළවල් ඇති කිරිම, දියර කිරි ප්‍රවර්ධනය, තෘණ වගාව ඇති කිරිම, පැටවුන්, පුහුණුව සහ තාක්‍ෂණික සහාය ලබාදීම.
- සත්ත්ව පාලන අගයදාම සංවර්ධන ව්‍යාපෘති ආදිය ක්‍රියාත්මක කිරිම.

**iii.ධීවර වැඩසටහන**

- මත්ස්‍ය වගාව, මාළු ආහාර / මුහුදු පැලෑටි නිෂ්පාදනය, විසිතුරු මත්ස්‍ය වගාව, ධීවර ආම්පන්න හා තාක්‍ෂණික සහාය ආදිය ලබා දීම.
- ධීවර අගයදාම ව්‍යාපෘති සංවර්ධනය කිරිම ආදි ව්‍යාපෘති

**iv.**ගෘහ ආශ්‍රිත කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධනය - කර්මාන්ත අභිමුඛ ව්‍යාපෘති හා නව නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත ඇති කිරිම. දේශිය නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරිම හා සහාය ලබා දීම ආදි ව්‍යාපෘති

**v.**රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු වැඩසටහන - සමෘද්ධිලාභී හා අඩුආදායම්ලාභි පවුල් වල අවුරුදු 18 – 40 අතර තරුණ තරුණියන් ඵලදායි ආර්ථික ක්‍රියාවලියක නිරත කරවිමට අවශ්‍ය රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණුව ලබා දීම. මේ යටතේ ප්‍රතිලාභින් පදිංචි දිස්ත්‍රික්ක තුල පිහිටි පෞද්ගලික ආයතනයන්ට අවශ්‍ය ශ්‍රමිකයන් වෘත්තීය හා ශිල්පීය ඥාණය ලබා දීම හරහා රැකියාගත කිරිම, උපකරණ කට්ටල ලබා දීම.

**vi.**අලෙවි සංවර්ධන වැඩසටහන - භාණ්ඩ හා සේවා නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනයට අදාල ව්‍යාපෘති හා අවශ්‍ය තාක්ෂණය හා උපකරණ ලබා දීම.
- මෙහිදි සෑම වසමකින්ම අලෙවි ව්‍යාපෘතියක් හඳුනා ගැනිම අත්‍යාවශ්‍ය වනු ඇත

**vii.**තිරසර පරිභෝජන හා ගෘහ ආර්ථිකය කළමනාකරණය - ගෘහස්ථ විදුලි පරිභෝජනයේදී අඩු වියදම් බල්බ භාවිතය ප්‍රචලිත කිරිම , පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය අධෛර්යමත් කිරිම, ගෘහස්ථ අපද්‍රව්‍ය වෙන් කිරිම, ප්‍රතිචක්‍රියකරණයට ක්‍රම වේද හඳුන්වා දීම. කාබනික පොහොර භාවිතය, වැසි ජල කළමණාකරණ ක්‍රමවේද හඳුන්වා දීම. කුටුම්භයන් තුළ මුල්‍ය කලමනාකරණය, ග්‍රාමීය ඉතුරුම් ඉහළ නැංවීම.

ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි සමජාතිය නිෂ්පාදනයන්ට අදාලව ව්‍යාපෘතිලාභින් සිටියි නම් **සෞභාග්‍යා - සමෘද්ධි නිෂ්පාදන ගම්මානයන්** ලෙස සංවර්ධනය කිරිමටද ඔබ වෙත අවස්ථාව හිමි වේ. ප්‍රතිලාභින් සංඛ්‍යාව ප්‍රාදේශිය සම්බන්ධිකරන කමිටුව මඟින් තීරණය කිරිමට හැකියාව ඇත. මෙහිදි අමාත්‍යාංශයේ ඉහත චක්‍රලේඛයේ ඡේද අංක 3.2 පරිදි එම ගම්මානයන්හි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි කටයුතු කළයුතු අතර මේ වන විටත් ඔබ විසින් මා වෙත එවන ලද ගම්මානයන් මෙයට අයත් වනු ඇත.

## ඉලක්ක කණ්ඩායම

**සමෘද්ධි සහනාධාරලාභි පවුල් සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන** යටතේ ඔබ දිස්ත්‍රික්කයෙන් හඳුනාගත් **“ සවිබලගැන්විය හැකි ”** සමෘද්ධි සහනාධාරලාභි **“ඉහළ”** කාණ්ඩයේ ප්‍රතිලාභින් පහත සඳහන් නිර්ණායකයන්ට අනුව මේ වැඩසටහන සඳහා තෝරා ගත යුතුය.

1. සවිබල ගැන්වීම කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන සමෘද්ධි සහනාධාරලාභියකු වීම.
2. දැනට ජිවන මාර්ගයක නිරත හෝ නිරතවිමට අපේක්ෂා කරන්නෙකු වීම.
3. ඔහුට හෝ පවුලේ සමාජිකයකුට යෝජිත ජීවන මාර්ගය පිළිබඳව දැනුමක් (පුහුණුවක්, පළපුරුද්දක්) හෝ අත්දැකිමක් ඇති අයකුවීම.

4. යෝජිත ජීවන මාර්ගය ක්‍රියාත්මක වීම තුලින් ප්‍රතිලාභියාට මසකට සැලකිය යුතු ලාභයක් ලබා ගැනිමට ඇති හැකියාව.
5. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉඩ කඩ ප්‍රමාණවත්ව ප්‍රතිලාභියා සතුවීම.
6. යෝජිත නිෂ්පාදනය හෝ සේවාව සඳහා ප්‍රමාණවත් වෙළඳ පලක් පැවතීම.
7. එම ව්‍යාපෘතිය සඳහා අත්‍යවශ්‍ය පහසුකම් පැවතීම.
8. ග්‍රාමීය කමිටුවේ නිර්දේශිත අයකු වීම

## ක්‍රියාත්මක ක්‍රමවේදය.

**a)** ඉහත පරිදි පළමුව සමෘද්ධිලාභි ගෘහ ආර්ථික ඒකක ශක්තිමත් කරලීමේ ජාතික වැඩසටහන යටතේ ඔබ දිස්ත්‍රික්කයේ සෑම ග්‍රාම නිලධාරි වසමකින්ම හඳුනාගත් **“ සවිබලගැන්විය හැකි”** සමෘද්ධි සහනාධාරලාභි **“ඉහළ”** කාණ්ඩයේ ප්‍රතිලාභින් හඳුනා ගැනිම.

b) මෙහිදි අනිවාර්යයෙන්ම අදාල ප්‍රතිලාභියා නිරත හෝ නිරත වීමට කැමැති කුඩා ව්‍යවසාය / ස්වයං රැකියාවද හඳුනා ගත යුතුවේ.

c) එම කුඩා ව්‍යවසාය / ස්වයං රැකියාව ඇරඹීමට හෝ පවත්නා තත්ත්වය වර්ධනය කිරිම සඳහා මෙම වැඩසටහන මඟින් ලබා දිය යුතු ප්‍රමුඛ භාණ්ඩ / සේවා ද හඳුනා ගත යුතුය.

d) මෙහිදි **ග්‍රාමීය ප්‍රජාමූල සංවිධානවලද දායකත්වය ලබා ගනිමින් ප්‍රතිලාභින්ගේ හැකියාව, රුචිකත්වය හා** විභවතාවය අනුව ඒ ඒ ජීවනෝපාය ක්ෂේත්‍රයන් හඳුනා ගැනිම සුදුසු වනු ඇත.

e) **“සවිබල ගැන්විය හැකි”** සමෘද්ධි සහනාධාරලාභි **“ ඉහළ ”** කාණ්ඩයේ ප්‍රතිලාභින් ගෙන් අවම වශයෙන් 20 දෙනෙකු ඇතුලත් සමෘද්ධි සහනාධාරලාභි ව්‍යාපෘතිලාභින් හා ඊට අදාල ව්‍යාපෘති යෝජනා පහත සඳහන් ග්‍රාමීය කමිටුව විසින් හඳුනා ගත යුතුය.

**ව්‍යාපෘති සඳහා පවුල් තෝරා ගැනීමේ ග්‍රාමීය කමිටු සංයුතිය**

1. ප්‍රදේශයේ විහාරස්ථානවල විහාරාධිපති ස්වාමීන් වහන්සේලා, අනෙකුත් ආගමික පූජකතුමන්ලා
2. පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්
3. සමෘද්ධි සංවර්ධන නිලධාරි
4. ආර්ථික සංවර්ධන නිලධාරි
5. ග්‍රාම නිලධාරි
6. කෘෂිකර්ම සංවර්ධන පර්යේෂණ නිලධාරි
7. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි
8. ප්‍රජා සංවිධාන නායකයින්

f) මෙහිදි ග්‍රාමීය කමිටුවේ ජීවනෝපාය ව්‍යාපෘති සම්බන්ධිකරණය, සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් කල යුතුවේ.

g) ග්‍රාමීය කමිටුව විසින් නිර්දේශිත ව්‍යාපෘතිලාභී ලයිස්තුව හා යෝජිත ව්‍යාපෘති ලේඛනය ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරිමෙන් අනතුරුව එම කමිටුවේ අනුමැතිය ලද ප්‍රතිලාභින්ට සුළු පරිමාණයේ ව්‍යවසායන් සඳහා සහාය හිමි වන අතර ඔවුන් 2021 වසර තුල ආර්ථික හා සාමාජිය වශයෙන් ශක්තිමත් කොට සවිබලගැන්විමට යෝජිත වේ.

h) මෙහිදි ප්‍රාදේශිය සම්බන්ධීකරණ ජීවනෝපාය අනුකමිටුවේ හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය ව්‍යාපෘති විෂයභාර හා මූලස්ථාන කළමණාකරු විසින් ඉටු කල යුතුය.

i) ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලද ව්‍යාපෘති ලැයිස්තුව, දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් විසින් අනුමැතිය හා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ඇත.

j) දිස්ත්‍රික් සම්බන්ධීකරණ ජීවනෝපාය අනුකමිටුවේ හා අනෙකුත් ආයතන සම්බන්ධීකරණය, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ විසින් කල යුතුය.

k) ඉහත පරිදි සියළු ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාමීය කමිටුවලින් නිර්දේශිත, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් අනුමැතිය ලබන සමෘද්ධි ප්‍රතිලාභීන් 200,000 ක් මෙම වැඩසටහනේ ප්‍රතිලාභීන් වනු ඇත.

l) මෙහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට හිමි මුළු ව්‍යාපෘති සංඛ්‍යාව අවශ්‍ය පරිදි ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ගලපා ගැනීමේ බලය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට හිමිවේ.

m) තෝරා ගනු ලබන මෙම සමෘද්ධි ව්‍යාපෘතිලාභීන් සඳහා පවුල් පැතිකඩක් සකස් කල යුතු අතර **ශදුඅත** (ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන) විශ්ලේෂණය කර පවුල් සංවර්ධන සැලැස්ම හා එය අශ්‍රය කරගෙන පවුලට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම කල යුතුය.

n) තෝරා ගත් සියළු ප්‍රතිලාභීන් සඳහා මූල්‍ය සාක්ෂරතාවය සඳහා පුහුණුවක් ලබා දෙන අතර එකී පුහුණුවට සහභාගී නොවන ජ්‍රතිලාභීන්ට මෙම ව්‍යාපෘතිය හිමි නොවනු ඇත.

o) ශදුඅත විශ්ලේෂණය මඟින් දුර්වලතා හා තර්ජන පදනම් කරගෙන සකස් කරන ලද සමාජ සංවර්ධන ක්‍රියාකාරී සැලැස්මේ දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය.

p) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලද පසු එකී දිස්ත්‍රික් සංවර්ධන ලේඛණය අංශ අනුව (කෘෂිකර්ම, සත්ත්ව පාලන ආදී....) සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මටද පිටපතක් සහිතව එහි පිටපත් දිස්ත්‍රික් ලේකම්ගේ අත්සනින් අදාල විෂය භාර රේඛීය අමාත්‍යාංශයට හෝ රේඛීය ආයතනයට යොමු කළ යුතුවේ.

q) එසේ අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගත් ක්ෂේත්‍රයට අදාල විෂය භාර නිලධාරී විසින් එම ආයතනයට අදාල ව්‍යාපෘති තෝරා ගනු ලබයි.

r) අනුමත ව්‍යාපෘති ලැයිස්තුව මා වෙත ලද පසු ව්‍යාපෘතිවලට අදාල ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කිරීමට අදාල නිර්දේශය මා විසින් අප අමාත්‍යාංශය වෙත ලබා දීමට කටයුතු කරනු ඇත.

s) ඔබ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කල යුතු අත්‍යාවශ්‍යම ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් අභියාචනා වේ නම් එම ව්‍යාපෘති සඳහා වන ඉල්ලීම් මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

t) දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කරනු ඇත.

u) අදාල ක්ෂේත්‍ර නිලධාරීන් එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරියාට අවශ්‍ය ක්ෂේත්‍රයේ පහසුකරණය හා සම්බන්ධීකරණය, ව්‍යාපෘති කළමණාකරු හා වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් ලබා දිය යුතුය.

v) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමේ වගකීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරෙන බැවින් නිරතුරුව ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳව ආයතන සම්බන්ධීකරණය, පසු විපරම හා ප්‍රගතිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම මෙන්ම අධීක්ෂණයද ව්‍යාපෘති විෂය භාර සමෘද්ධි කළමණාකරු, මුලස්ථාන, බැංකු සමිති හා කලාප කළමණාකරුවන් විසින් සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහයෝගයෙන් සිදුකල යුතුය.

w) දිස්ත්‍රික් අධීක්ෂණය, පසුවිපරම හා ප්‍රගතිය, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට හා මා වෙත ඉදිරිපත් කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතුය.

## තාක්ෂණික පුහුණුව ලබා දීම

1. **කෘෂිකර්මය** - කෘෂිකර්ම උපදේශක මඟින් ගොවිජන සේවා මට්ටමින් සංවිධාන කර ගත යුතුය.
2. **ධීවර** - තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා අභිජනන මධ්‍යස්ථාන මට්ටමින් හා තාක්ෂණික පුහුණු මධ්‍යස්ථාන වලදී.
3. **සත්ත්ව පාලන** - පශු වෛද්‍ය කාර්යාල මට්ටමින් ක්ෂේත්‍ර ගොවිපල වලදී හෝ දිස්ත්‍රික් මට්ටමේ පුහුණු මධ්‍යස්ථාන වලදී.
4. **ගෘහ කර්මාන්ත** - තාක්ෂණික පහසුකම් සහිත ආයතන සම්බන්ධීකරණය මඟින් (ආර්ථික පුනර්ජීවණය හා දරිද්‍රතාවය පිටු දැකීම සඳහා වන ජනාධිපති කාර්‍ය සාධක බලකාය විසින් නිකුත් කරන ලද අත්පොත භාවිතා කළ හැකිය.)

## කාල රාමුව

| අයිතමය | කාලය | වගකීම |
|---|---|---|
| 1. චක්‍රලේඛ උපදෙස් හා මග පෙන්වීම් සම්බන්ධයෙන් නිලධාරීන් දැනුම්වත් කිරීම | 2021.02.18 සිට 2021.02.29 | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහාකාර අධ්‍යක්ෂ |
| 2. වැඩසටහන පිළිබඳව ග්‍රාමීය ප්‍රජාව දැණුම්වත් කිරීම | 2021.02.20 සිට 2021.02.29 | සමෘද්ධි ව්‍යාපෘති / මුලස්ථාන / සමිති / කලාප කළමණාකරු |
| 3. වැඩසටහන දිවයින පුරා ආරම්භ කිරීම | 2021.03.02 සිට | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහාකාර අධ්‍යක්ෂ |
| 4. ජීවනෝපාය ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිලාභීන් හඳුනා ගැනීම | 2021.02.18 සිට 2021.03.20 | සමෘද්ධි ව්‍යාපෘති / කලාප / සමිති කළමණාකරු / සමෘද්ධි සංවර්ධන නිලධාරි / ග්‍රාමීය නායකයින් |
| 5. ග්‍රාම නිලධාරි වසමක් සඳහා ක්‍රියාත්මක ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම | 2021.02.25 සිට 2021.04.10 | ග්‍රාමීය කමිටුව |
| 6. ප්‍රාදේශීය ජීවනෝපාය කමිටුව වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම | 2021.03.01 සිට 2021.04.20 | ග්‍රාමීය කමිටුව |

| | | | |
|---|---|---|---|
| 7. | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති අනුමත කිරිම | 2021.03.01 සිට 2021.05.10 | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව |
| 8. | දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති හා ප්‍රතිපාදන අනුමත කිරිම | 2021.03.20 සිට | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව |
| 9. | අමාත්‍යාංශ වෙතින් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අනුමත ව්‍යාපෘති ලැයිස්තුව අප දෙපාර්තමේන්තුව වෙත යොමු කිරිම | 2021.03.25 සිට | දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ |
| 10. | අවශ්‍ය තාක්ෂණික පුහුණුව, ව්‍යාපාර පුහුණුව, මුල්‍ය සාක්ෂරතාවය, ණය පහසුකම් ලබා දීම | 2021.03.02 සිට | ව්‍යාපෘති ක්ෂේත්‍රයට අදාල ආයතන වල නිලධාරින් / ව්‍යාපෘති / මුලස්ථාන / සමිති හා සමෘද්ධි බැංකු කළමණාකරු |
| 11. | ව්‍යාපෘති ඇගයීම හා ප්‍රගති පාලනය | 2021.03.02 සිට | ප්‍රාදේශීය ලේකම් / සමෘද්ධි ව්‍යාපෘති / මුලස්ථාන / කලාප / සමිති කළමණාකරු / සමෘද්ධි සංවර්ධන නිලධාරි |
| 12. | ව්‍යාපෘති නිම කිරිම | 2021.11.30 | ප්‍රාදේශීය ලේකම් / ව්‍යාපෘති / මුලස්ථාන / සමිති / කලාප කළමණාකරු / සමෘද්ධි සංවර්ධන නිලධාරි |

## ප්‍රතිපාදන වෙන් කිරිම

රජයේ දායකත්වය, ව්‍යාපෘති ඇස්තමේන්තු අගයෙන් 60% ක් විය යුතු අතර එක් ප්‍රතිලාභියෙක් වෙනුවෙන් ලබා දිය හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු. 50,000 /- කි. මෙම මුදල ව්‍යාපෘතියේ ස්වභාවය හා ප්‍රදේශිය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය මත උපරිමය රු.100,000 දක්වා වැඩි කල හැකි නමුත් එය අත්‍යාවශ්‍යම හා සීමා සහිත වු පිරිසක් සඳහා විය යුතු මෙන්ම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට වෙන් වන මුළු ප්‍රතිපාදන සීමාව තුල ගලපා ගත යුතුවේ. එමෙන්ම මෙහිදි අවම ප්‍රතිලාභි දායකත්වය 40% ක් විය යුතුය. මෙය මුදලින් හෝ ශ්‍රමයෙන් හෝ යෙදවුම් හෝ භාණ්ඩ හෝ ස්ථාවර වත්කම් විය හැකිය.

**සහන ණය පොලී අනුපාත යටතේ ණය පහසුකම් ලබා දීම**

මේ සඳහා මහ බැංකුව, ප්‍රදේශිය සංවර්ධන බැංකුව, මහජන බැකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව ජාතික ඉතිරි කිරිමේ බැංකුව, ලංකා බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, ව්‍යාපාර සංවර්ධන සමුපාකාර බංකුව, කොමර්ෂල් බැංකුව, නේෂන්ට්‍රස්ට් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව, හා ඩිෆ්සීසී බැංකුව මඟින් සහන පොලී අනුපාතය යටතේ ණය පහසුකම් ලබා ගැනිමේ හැකියාව ලබා දී ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකුව මඟින් මෙම වැඩසටහන සඳහා 7% ක සහන පොලී අනුපාතය යටතේ රු.මි. 2.0 ක් දක්වා වු ණය මුදලක් ලබා දීමට කටයුතු කරනු ඇත.

එමෙන්ම ස්වේච්ඡාවෙන් සවිබලගැන්වෙන හා ඉදිරියේදි මෙම වැඩසටහන යටතේ සවිබලගැන්වීමට කැමැත්තක් දක්වන ප්‍රතිලාභින් සඳහා 4% ක් වු පොලී ප්‍රතිශතයක් යටතේ රු.500,000 ක් දක්වා ණය පහසුකම් ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති

සඳහා ලබා දිය හැකිය. සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකුව විසින් ලබා දෙනු ලබන ප්‍රතිලාභ එලෙසින්ම හිමි වනු ඇත.

## පරිපාලන වියදම්

අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ඉහත චක්‍රලේඛය පරිදි ව්‍යාපෘති සඳහා දරණ ලද සත්‍ය වියදමෙන් 0.5% ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහාද 2% ක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහාද වන පරිදි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් හා පරිපාලන වියදම් ලෙස වෙන් කර ගත හැකි වේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී රජයේ අනුමත ප්‍රසම්පාදන ක්‍රමවේදය, මුදල් රෙගුලාසි, චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරිම අත්‍යාවශ්‍ය වේ.

## අධීක්ෂණය, මෙහෙයවීම හා ඇගයීම

i. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී, ව්‍යාපෘති කළමණාකරු ,ප්‍රජා මූල බැංකු කළමණාකරු සහ ප්‍රජා මූල සමිති නිලධාරීන් ඇතුළු ග්‍රාමීය කමිටුව මසකට වරක් රැස්වී කොට්ඨාශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති, සාර්ථකව නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව සාකච්ඡා කිරිම, ගැටළු සඳහා අවශ්‍ය පියවර ගැනිම හා යාවත්කාලීන කිරිම කළ යුතුවේ.

ii. මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කරවීම සඳහා සමෘද්ධි නිලධාරි පුරප්පාඩු පවතින වසම් වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශයේ හෝ ප්‍රජාමූල බැංකු වල හෝ ප්‍රජාමූල බැංකු සමිති වල සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරින් යොදවා ගෙන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරෙනු ඇත.

iii. මෙම වැඩසටහන සමෘද්ධි කළමණාකරුවන්ගේ නිරන්තර අධික්ෂණය යටතේ සංවර්ධන කාර්යයක් ලෙස ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රාදේශිය ලේකම්ගේ මූලිකත්වයෙන් මසකට වරක් රැස්වී, ක්‍රියාත්මක ව්‍යාපෘති සාර්ථකව නියමිත අරමුණු කරා යන්නේද පිළිබඳව සාකච්ඡා කිරිම, ගැටළු සඳහා අවශ්‍ය පියවර ගැනිම සඳහා කටයුතු කළ යුතුවේ.

iv. ව්‍යාපෘතිලාභීන් මෙම ව්‍යාපෘතිය යටතේ සවිබල ගැන්වූ පසු ස්වේච්ඡාවෙන් සවිබලගැන්වෙන කාණ්ඩයට මෙම සමෘද්ධිලාභීන් ඇතුලත් කිරිම කළ යුතුය.

v. ශුද්ධත විශ්ලේෂණය මඟින් ව්‍යාපෘති හඳුනා ගැනීමේදි ඔවුන්ගේ අවශ්‍යතාවය, නිවසට / වගා බිමට / වැඩපලට ගොස් නිරික්ෂණය කර පෞද්ගලිකව හා කණ්ඩායමක් ලෙස සෑහීමකට පත් වීමෙන් පසුව ප්‍රමුඛතම අවශ්‍යතාවය හෝ අවශ්‍යතා තීරණය කළ යුතුය.

vi. මෙහිදී ප්‍රජා මූල සංවිධාන ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කළ යුතු වේ.

vii. ප්‍රගතිය අවශ්‍ය ඕනෑම විටක ප්‍රධාන කාර්යාලය වෙත ලබා දිය හැකි පරිදි සකස් කිරිමටත් යාවත්කාලින කිරිමටත් කටයුතු කළ යුතු වේ.

viii. **'සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වීම '** අරමුණු කර ගනිමින් සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක වීම කෙරෙහි දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන් නිරන්තර අවධානය යොමු කළ යුතුවේ.

ix. ඉහත සියළු වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරිම සඳහා ඔබ ඇතුළු සියළුම නිලධාරින්ගේ කැපවීම අගය කොට සලකන අතර මේ පිළිබඳව වැඩිදුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801

මගින් හෝ divinegumalh@yahoo.com /jeevonopaya@gmail.com විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ජීවනෝපාය අංශය අමතන ලෙස කාරුණිකව දන්වමි.

*මෙම උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කිරීමේදී ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකායේ ජාතික සම්බන්ධීකරන ජීවනෝපාය අනු කමිටුවේ උපදෙස් හා මගපෙන්වීම්ද සැලකිල්ලට ගත් බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.*

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. සභාපති, ජාතික සම්බන්ධීකරන ජීවනෝපාය අනු කමිටුව, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.පි
2. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් - කා.දැ.ගැ.පි
3. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් - කා.දැ.ගැ.පි
4. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි
5. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.පි
6. ලේකම්, පළාත්පාලන අමාත්‍යාංශය
7. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
8. ලේකම්, වැවිලි අමාත්‍යාංශය
9. ලේකම්, ධීවර අමාත්‍යාංශය
10. ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
11. ලේකම්, සංචාරක අමාත්‍යාංශය
12. ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
13. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
14. ලේකම්, වී හා ධාන්‍ය, කාබනික ආහාර, එලවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල වගාප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය
15. ලේකම්, විසිතුරු මසුන්,මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම ,ධිවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය
16. ලේකම්. වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
17. ලේකම්, බතික් ,අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
18. ලේකම්, උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු , කරාබුනැටි,බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
19. ලේකම්, පළාත් සභා රාජ්‍ය අමාත්‍යාංශය
20. ලේකම්, නිපුනතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
21. ලේකම්, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය
22. ලේකම්, මැණික් හා ස්වරණාභරන ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
23. ලේකම්, පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
24. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
25. සියළුම අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
26. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

(6 – 26) කා.දැ.ගැ.ස/ අ.ක.ස